# නාඳුනන දේසේ "පිනි" මව්බිමෙන් ඇගැයෙයි






"ආනයනික මානසිකත්වය" යන්න කෙතරම් දුරට නිවැරදි යෙදුමක් ද යන්න නොදනිමු. ඒ අප ඇසුවක් හෝ කියවුවක් නොවන බැවිනි. එසේ වුවද යම් දෙයක් පිටින් ගෙන්වීමට සිතෙහි ඇති නැඹුරුව "ආනයනික මානසිකත්වය" යනුවෙන් අපි හඳුන්වමු.

වසර හාරසීයකට අධික කාලයක් තිස්සේ යටත් විජිත වාසීන් ලෙස සිතීමට හුරුවුවන්ගේ දීන මානසිකත්වයේ එක් අතුරුපලයකි, "ආනයනික මානසිකත්වය". පිට රටින් ගෙන් වූ "රට හාල්", " රට ඇඟළුම්" වලට වැඩි ඉල්ලුමක් පැවතිණ. තමන් අවට, තමන් අතර ඇති සම්පත් හඳුනා නොගැනීමට එක් හේතුවක් වන්නේත් මේ මානසිකත්වයයි. නිතර දකින "කුකුළු කරමලය සුදු වීම" තවත් හේතුවක් විය හැකිය. තමන්ගේ දේ ඇගයීම වෙනුවට පිටින් ආනයනය කරනා දේ ඇගැයීම පසුපස කුහක මානසිකත්වය ද නැතුවා නොවේ. මව්බිමින් සංක්‍රමණය වී පිට රටක පදිංචි වූ අප අතරට මේ අවගුණ ද සංක්‍රමණය වී ඇතුවා සේ හැඟෙයි.

මෙලෙසින් පූර්විකා ලිවීමට හේතුවන්නේ අප අතර සිටිනා ලේඛකයෙකු, මාධ්‍යවේදියෙකු, කවියෙකු හා ගීත රචකයකු වන ජගත් ජේ. එදිරිසිංහයන්ගේ "පිනි" නවකතාව මව් බිමේ දයාවංශ ජයකොඩි සමාගමේ සම්මානයට පාත්‍රව තිළිණ ලැබීමය. අප අතර සිටිනා නිර්මාණකරුවන්ගේ දේ නොසැලකිල්ලට ලක් කරමින් මව් බිමෙන් නිර්මාණ ආනයනය කෙරෙද්දී, මෙහි නිර්මාණ මව් බිමෙන් පිදුම් ලබයි !

"පිනි" අත් පිටපත මව් බිමේ දයාවංශ ජයකොඩි සමාගමට යොමු කරවන ලද්දේ ප්‍රකාශයට පත්කරවීම සඳහායි. වසරේ හොඳම නවකතාව ලෙස එම සමාගම තෝරාගත්තේ එම අත් පිටපතයි.

"ගී සඳළුව" යටතේ ගීතයක වටපිටාව පිළිබඳව ඊට සම්බන්ධ නිර්මාණකරුවන් සමඟ පිළිසඳරක යෙදී ලිපියක් ලිවීමටත්, ඔවුන්ගේ ආලේඛ්‍ය චිත්‍ර ඇඳීමටත් යෝජනා කළේ ජගත් ජේ. එදිරිසිංහ සොයුරායි. ඒ අනුව ලියැවෙන "ගී සඳළුව" ලිපියට මෙවර ඇරයුම් ලබන්නේ ඔහුයි. ගීතයක වටපිටාව වෙනුවට මෙවර අප විමසිලිමත් වුයේ ජගත් ජේ. එදිරිසිංහ ගී පද නිබන්ධකයාගේ වටපිටාව පිළිබඳවයි.

"මම නවකතාවක් මුලින්ම ලියන්නේ හයේ පන්තියේදී ...." ජගත් අප හා පිළිසඳරකට එක් වෙයි.

" ඒ කාලේ අපි ඔය "මුවන් පැළැස්ස" ගුවන් විදුලි නාට්‍ය අහන කාලෙයි. ඉතින් ලොකු මොනිටර් ඇක්සයිස් පොතක ලියපු ඒ මුල්ම කතාව ලිව්වෙත් ඒ වාගේ පරිසරයක් පසුබිම් කරගෙන. ඒකෙ නම "ලන්දේගම". ඔය නව කතාවේ දෙවෙනි කොටසකුත් ලිව්වා. ඒ " අළුත් ඉරක් පායලා" කියන නවකතාව. ඒකට වස්තු බීජය වුනේ ගමේ අළුතින් පාසලක් හදනකොට ඇතිවෙන ගැටළු...."

තුරුණු වියේදීම සමාජයික ගැටළු පිළිබඳව සාකච්ජා කිරීමට ජගත් උනන්දු වූ අයුරුය, ඒ. ජගත් සිය අතීතාවර්ජනය තව දුරටත් කරගෙන යයි....

"අපි ඔය උසස් පෙළ කරන කාලේ ප්‍රවීණ ලේඛක ජයකොඩි සෙනෙවිරත්න මහත්තයා එතුමගෙ "මල් මැණිකේ" නවකතාවෙ පසුවදනක කියලා තිබුණා ආධුනිකයින්ට අත දෙනවාය කියලා. මේ කාලයේ මම හිටියෙ උසස්පෙළ පන්තියෙ. මගේ තුන්වන නවකතාව ලියලා. ඉතින් පොතක් ප්‍රකාශ කරවාගන්න තියෙන උනන්දුව නිසාම සෙනෙවිරත්න මහත්තයාට මම ලියුමක් යැව්වා. ඉතින් ඒ මහත්තයා ලියලා එව්වා පොත එවන්න කියලා. මම පොත තැපෑලෙන් යැව්වා. ඊට පස්සේ ඒ මහත්තයා ලියලා එවලා තිබුණා ඇවිත් තමාව මුණගැහෙන්න කියලා..."

"එක්තරා දවසක මම නුගේගොඩින් 183 පානදුර බස් එකේ නැගලා වළානේ ඒ මහත්තයාගේ ගෙදර ගියා මට මතකයි. උසස් පෙළ ළමයෙක් හැටියට අතේ තිබුණ සල්ලි වලින් කේක් එකක් විතරයි අරගෙන යන්න පුළුවන් වුණේ. ඉතින් ඒ මහත්තයා මාව ගෙදර සාලයේ වාඩි කරවාගෙන පොත ගැන අදහස් දැක්වුවා. අන්තිමට කියපු දේ මට අද වාගේ මතකය.

"ඔයා හොඳට ලියනවා; ඒත් පොත් අච්චු ගහන්න හදිස්සි වෙන්න එපා..."

"ඊට පස්සේ කාලෙකට මොනවවත් ලියවුනේ නෑ. ඒත් හිතේ කරුණු රාශියක් එකතු වුණා. මගේ අයියා පුෂ්ප කුමාර එදිරිසිංහත් ඒ කාලේ හරියට ලිව්වා. මාමා කෙනෙක් හිටියා ලයනල් සරත් කියලා. එයාත් හොඳ ලේඛකයෙක්. දෙන්නාගේම බලපෑම් මගේ අර ලියන්න තිබුණ ආසාවට එකතු වුණා. අපේ තාත්තාගේ ව්‍යාපාරයක රැකියාවට ආවා 71 කැරැල්ලේ දී සිරගත වෙලා ඉඳලා නිදහස් වුණ තිලකරත්න පෙතියාගොඩ කියලා තරුණයෙක්. මේ තරුණයා සිර ගෙදරදී ලියපු නවකතාත් මට කියවන්න ලැබුණා. ඉතින් ඔය දේවල් හැම දේකම බලපෑමක් ඇතිව අර කලින් නව කතාව ලිව්වට අවුරුදු විසි පහකට විතර පස්සේ තමයි පොතක් මුද්‍රණය කළේ. ඒ 1999 අවුරුද්දේ දී එළි දක්වපු "කන්ද උඩ මාළිගාව" කෙටිකතා පොත.

ජගත් තවදුරටත් සිය මතකය අවදි කරවයි. " උසස් පෙළ කරලා ඉවර වුණාට පස්සෙ ලංකාවෙදි "විද්‍යාව" කියලා පත්තරයක් පළකලා. රස්සාවල යෙදුණ නිසා විවේකයත් අඩු වුණා. "සිසිරයේ පිපුණ මල", කියන කවි පොතයි, "අන්තර් ජාලයට පියවර" කියන පොතයි එළි දක්වන්න පුළුවන් වුණා. 2002 දී "අසුර අඩවිය" නවකතාව එළිදැක්වුණාට පස්සේ "ගිම්හාන සුළඟ", "තාරකා විජිතය", "ඉස්කෝලේ කාලේ", "අදිසි" කියන නවකතා එළිදැක්වුවා. මේ අතරේ පළවුණ "රජාලි පියාපත" කවි පොත ඒ වසරේ හොඳම පොත් පහ අතරට ලංකාවේ ගොඩගේ ප්‍රකාශකයින් නම් කරලා තිබුණා. මේ හැම පොතක්ම පළ කරන්න ලැබුණෙ මේ රටට ආවට පස්සෙයි."

*නුවර වාහල් දෙරටු පසුකර*
*ගම් නියම් ගම් සොයා පියමැන*
*නාඳුනන දේ සේ - සරන දන අතරේ*
*හුදෙකලා මිනිසා*

*බියකරුය මේ සිහිනේ*
*අත්වැලක් නැත සැදුනේ*
*මැකුන මං පෙත් සොයා යන්නට*
*ඉඩක් නැත ලැබුනේ*
*මේ විසල් නගරේ*

*ඈත ක්ෂිතිජ මානේ*
*කණාමැදිරි එළි දැල්වේ*
*දුබල පා යුග වාරු නැති සඳ*
*සිහින මිය යන්නේ*
*මේ විසල් නගරේ*

*රචනය : ජගත් ජේ. එදිරිසිංහ*
*තනුව හා සංගීතය : ලක්ඛිත ගුණතිලක*
*ගායනය : ලලිත් අරුණශාන්ත*

ජගත්ගේ කවි හා ගීත පද රචනා පිළිබඳව ද යමක් විමසිය යුතු වෙයි. ඔහු මෙලෙසින් ඒ පිළිබඳව සිහිපත් කරයි;

"මම ඉතින් මුල ඉඳන් ම කවි ලිව්වා. හත්වන පන්තියේ දී "ළපටි පෙළ" කියන පත්තරේ තමයි මුලින් ම කවි පන්තියක් පළවුණේ. "මිහිර" පත්තරේ මගේ කවි වගේම කාටුන් එහෙමත් පළවුණා. ඊට පස්සේ "නවයුගය", "දිවයින", " රාවය", "ලක්බිම" වගේ පත්තර වල මගේ කවි පළ වුණා."

"ඉස්සරවෙලාම කෙටි කතාවක් පළ වුණේ 1980 මුල් කාලයේ. "ජන සතිය" පත්තරේ. ළමා පිටුවට යවපු කෙටි කතාව ඒ අය පළ කළේ වැඩිහිටි කෙටි කතාවක් හැටියට. ඒ නිසා මම ලියන දේවල්වල "යමක් ඇති" කියලා හිතුණා."

මෙල්බර්න් නුවර මුලින් ම සිංහල පුවත්පතක් එළිදැක්වීමට පුරෝගාමී වු ජගත් ජේ. එදිරිසිංහයන් ඊට යොමු වූ අන්දම පිළිබඳව අපි උනන්දු වීමු.

"මම හරියට ගරු කරනවා සිංහල භාෂාවට. ඒක තමයි අපට තියෙන හොඳම මෙවලම අපේ දෙයක් ගැන ලියන්න, කියන්න. මම කැමති නෑ ඒ මෙවලම වැරදි විදියට පාවිච්චි කරනව දකින්න. මොනවා හරි ලියන්න කියන හින්ද ලියනවා ය කියන එකක් නෑ මා ගාව."

"ඒ කාලෙ "සෙරන්ඩිබ්" පත්තරේ සිංහල පිටුවක් ආරම්භ කළා. ඒකේ අඩු පාඩු පෙන්නලා මම ඒ අදාල අයට ලිව්වා. 1999 වසරේ දවසක "කන්ද උඩ මාළිගාව" පොත ගැන උපා උපදස මහත්මයත් එක්ක තිබුණ ගුවන් විදුලි සාකච්ඡාවකට රෝහණ කරුණාරත්න මහත්තයත් එක්ක ගිය වෙලාවෙ "සෙරන්ඩිබ්" මාසිකයේ විරෝජ්වයි, සංස- "කාරිකා, ගීතිකායි මුණගැහුණා. ඒ අය මට ආරාධනා කළා සිංහල පිටුව බාරගෙන ඉදිරියට කරගෙන යන්න කියලා. මං කැමති වුණා. මං ඉන්න කාලෙ සිංහල පිටු හතරක් වෙනකල් වැඩිවුණා. ඒ කියන්නේ සිංහල ලිපි ලියන අය වැඩි කරගන්න අපට පුළුවන් වුණා. අපේ අරමුණ වුණේම මේ රටේ සිංහලෙන් ලියන අය දිරිමත් කිරීමමයි

වෙනම ම සිංහල මාසිකයක් තිබුණොත් හොඳයි කියන අදහස හැමදම තිබුණා. අලුතින් සිංහල ප්‍රකාශනයක් ආරම්භ කරන්න කියල බන්දු දිසානායක මහත්තයත් 2002 වසරේදි පමණ කීප වතාවක් මට කිව්වා ඒ සඳහා මුදල් වියදම් කරන්නත් ඔහු කැමති බවත් කිව්වා මොනයම් හෝ හේතු නිසා මට ඒ අදහස ක්‍රියාත්මක කරන්න ලැබුණෙ නැහැ

2003 වසරේ අප්‍රේල් මාසයේදි වරුණ සාවින්ද, අසෝක සිල්වා, ජගත් මුණසිංහ වගේ අය එක්ක "පහන" මාසිකය පටන් ගත්තා. ඒක කළේ අපි පවත්වාගෙන ගිය ෆෝකස් පදනමේ ව්‍යාපෘතියක් හැටියටයි. වරුණත් මමත් සම සංස්කාරකවරුන් ලෙස කටයුතු කළා. 2013 වෙනකොට "පහන" ට අවුරුදු දහයයි. ඒකට උත්සවයකුත් තිබුණාලු. ඒත් පත්තරයට මුල් වුණ අය ගැන සඳහනක්වත් නැති වුණ එක ගැන නම් කණගාටුයි..."

"පස්සේ කාලෙක අපි "සන්නස" පටන් ගත්තා. ඒ මීට අවුරුදු අටකට විතර උඩදී. ඔස්ට්‍රේලියාවෙ මගේ මුලු ජීවිතයම ගෙව්වෙ මේ පත්තර එක්කයි"

ජගත් දැනට "සන්නස" මාසිකයේ උපදේශක වරයායි. එමෙන්ම "කටු" නමින් නවකතාවක් ද "සන්නස" වෙනුවෙන් ලියයි. "තිසර" වෙබ් ගුවන්විදුලිය (www.thisaar.com) ඔහුගේ ශ්‍රව්‍ය මාධ්‍ය නාලිකාවය.

"ලෝකයේ රටවල් තිහක ශ්‍රාවකයින් දැන් තිසර අහනවා" ජගත් කියයි

අන්තර්ජාලයේ ප්‍රථම සිංහල නිර්මාණ සංග්‍රහය ආරම්භ කිරීමේ ගෞරවය හිමිවන්නේත් ජගත්ටයි. ඒ කැටපත්පවුර www.ketapath-pawra.com වෙබ් අඩවියයි.

දයාවංශ ජයකොඩි සමාගමේ සම්මානයට පාත්‍රව තිළිණ ලද "පිනි" නවකතාව වෙතට යොමු වීමු, ඉන් අනතුරුව.